# වයඹ පළාත් සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, වයඹ පළාත් සභාව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2:2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර, 2011 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ, සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) පළාත් සභා අරමුදල් ගිණුම

සමාලෝචිත වර්ෂයට අදාල පළාත් සභා අරමුදල් ගිණුම 2012 අප්‍රේල් 19 වන දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

(ආ) ආදායම් ගිණුම් ඉදිරිපත් නොකිරීම.

පළාත් මූල්‍ය රීති අනුව ආදායම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත බලය ලබා දී ඇත ගණන් දීමේ නිලධාරියා විසින් තමාට අයත් ආදායම් ගිණුම් සකස් කර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කලයුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ ආදායම් ශීර්ෂයන්ට අදාල ගිණුම් 2012 මාර්තු 31 දක්වා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාළව 2012 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

2011 වර්ෂයට අදාල

| | මූල්‍ය ප්‍රකාශනය | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉකුත් වර්ෂවලට අදාළව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i). | විසර්ජන ගිණුම | 26 | 26 | - | 05 |
| (ii). | ආදායම් ගිණුම් | 04 | - | 04 | 12 |
| (iii). | පළාත් සභා නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | 74 | 60 | 14 | 32 |
| (iv). | වාණිජ අත්තිකාරම් ගිණුම් | 07 | 05 | 02 | 02 |
| (v). | අරමුදල් ගිණුම් | 04 | 03 | 01 | 04 |
| (vi). | ප්‍රඥප්ති ගිණුම් | 09 | 09 | - | 17 |
| | එකතුව | 124 | 103 | 21 | 72 |

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

වයඹ පළාත් ක්‍රීඩා අරමුදලේ සථාවර තැන්පතු සඳහා ලැබුණු පොලිය රු. 730,022 ක් හා යාවජ්ජීව සාමාජිකයන්ගෙන් ලැබූ සාමාජික ගාස්තු රු. 600,000 ක් වශයෙන් එකතුව රු. 1,330,022 ක ආදායමක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි.

### 1.2.2 ගෙවිය යුතු ගිණුම්

වයඹ පළාත් සභාවට අයත් දෙපාර්තමේන්තු 02 ක අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු. 2,949,873 ක් විය.

### 1.2.3 අග්‍රිම ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 04 ක් විසින් සමාලෝචිත වර්ෂයේ ආයතනයට නොපිය වූ අග්‍රිම ශේෂය රු. 13,062,651 ක් වූ අතර, මෙම ශේෂ තුළ වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් නොකළ රු. 819,533 ක ශේෂයක් විය.

### 1.2.4 පොදු තැන්පත් ගිණුම්

මුදල් රෙගුලාසි 571 විධිවිධානය ප්‍රකාරව කටයුතු කළ හැකිව තිබුණද එසේ කටයුතු නොකළ, 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 ක කාලයක් ඉක්මවා තිබූ පොදු තැන්පත්වල වටිනාකම රු. 4,228,021 ක් විය.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් සාක්ෂි නොවීම් අනාවරණය විය.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 31 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 28,306,746 ක් විය.

(ආ) තොරතුරු ඉදිරිපත් නොකිරීම.

වයඹ පළාත් සභාවේ ආයතන 04 කට අදාලව පහත සඳහන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 343,919 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(i). භාණ්ඩ බෙදා දුන් බවට ලිඛිත තහවුරු

(ii). ජල පෙරන අලුත්වැඩියා කිරීම් විස්තර හා මිල ගණන්

(iii). භාණ්ඩ මිලදී ගැනීමේ අවශ්‍යතාවන්

## 1.2.6 අනුකූල නොවීම්.

නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි විධිවිධාන හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| (i). 1956 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත | ශිල්ප ශාලිකාවේ සේවය කරන සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන් රු. 57,978 ක මුදලක් සේව්‍යාගේ දායකත්වය වශයෙන් 2010 වර්ෂය සඳහා සේවක අර්ථ සාධක අරමුදලට ගෙවා නොතිබුණි. |
| (ii).1992 අංක 42 දරන වයඹ පළාත් ක්‍රීඩා ප්‍රඥප්ති යේ 15(4) වන හා 16 වන වගන්තිය | එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මණින් වයඹ පළාත් ක්‍රීඩා අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම් විසින් පිළයෙල කර විගණකාධිපතිවරයාගේ වාර්තාවද සමඟ වයඹ පළාත් සභාවට ඉදිරිපත් කල යුතු වුවත්, පසුගිය වර්ෂ සඳහා එම වාර්තා සකස් කර පළාත් සභාවට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) මුදල් රෙගුලාසි** | |
| මු.රෙ. අංක 571 | පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අවුරුදු 02 කට වැඩි කාලයක් තැන්පත් ගිණුමක රඳවාගෙන ඇති 2008 සහ 2009 වර්ෂයන්හි ලැබී තිබුණු රු. 250,564 ක මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ඇ) ආයතන සංග්‍රහය

| | |
|---|---|
| II පරිච්ඡේදයේ 13.3 හා 13.4 ඡේදය | වසර කිහිපයක සිට ගිරිඋල්ල හා නිකවැරටිය කලාපවල පාසල් 93 ක් සඳහා විදුහල්පති තනතුරුවල වැඩ බැලීම සඳහා සුදුසුකම් නොලත් ගුරු සේවයේ නිලධාරීන් පත්කර ඇතත්, එම තනතුරු සඳහා නිත්‍ය පත් කිරීම් කිරීමට 2011 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. |

(ඈ) රජයේ ටෙන්ඩර් කාර්ය පරිපාටිය පිළිබඳව වූ මාර්ගෝපදේශ සංග්‍රහය 2006 මාර්තු 01 දිනැති ප්‍රසම්පාදන චක්‍රලේඛය

| | |
|---|---|
| (i). 3.3 ඡේදය<br>2:7:7 ඡේදය | පසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර අවස්ථා 10 කදී රු.116,255 ක් වටිනා භාණ්ඩ ඩී.පී.වික්‍රමසිංහ විද්‍යාලය සහ රු.996,800 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් වයඹ ආණ්ඩුකාර කාර්යාලය සමාලෝචිත වර්ෂය තුළදී මිළදීගෙන තිබුණි. |
| (ii). 4.2.2. ඡේදය | 2011 වර්ෂය තුල මිළදී ගන්නා ලද රු.12,981,952 ක් වටිනා ලීබඩු හා උපකරණ අදාල පිරිවිතරවලට අනුකූල නොවූ නමුත් ඒ සඳහා සැපයුම්කරුවන් වෙත 2011 දෙසැම්බර් 31 දින ලියා තිබුණ චෙක්පත් 11 ක් 2012 අප්‍රේල් 02 දින දක්වා භාර දී නොතිබුණි. |

(ඉ) පළාත් මුල්‍ය රීති

| | |
|---|---|
| (i). පළාත් මුල්‍ය රීති 91.2 (ඉ) , 117.1 සහ 118 | 2011 වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක් විසින් රැස්කල ආදායම් වලින් රු. 20,541,020 ක් වටිනා ආදායම් පළාත් සභාව වෙත ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි. |
| (ii). පළාත් මුල්‍ය රීති 274 | පළාත් සභාවේ කිසිම ගිණුමකින් අයිරා ගැනීම තහනම්වුවත් විධිමත් අනුමැතියකින් තොරව ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2011 වර්ෂයේ අවස්ථා 05 කදී බැංකු අයිරා ලබාගෙන තිබුණි. |

| | |
|---|---|
| (iii). පළාත් මූල්‍ය රීති 283 | සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ ආයතන 04 ක පැවති මාස 6 ඉක්මවූ රු.6,221,514 ක් වටිනා චෙක්පත් සම්බන්ධව පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv). පළාත් මූල්‍ය රීති 560, 561.10 (ඉ), 477 | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ස්ථාපිත කර තිබෙන වායු සමීකරණ යන්ත්‍ර 23 ක් වත්කම් ලේඛණවලට ගෙන නොතිබුණ අතර, වාර්ෂිකව සමීක්ෂණයකරද නොතිබුණි. |

(ඊ) චක්‍රලේඛ

(i). මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ

| | |
|---|---|
| 2011 ජුලි 26 දිනැති මුදල් කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක FC/PSDG/&CBG/2011/1 | පළාත් ආයෝජන අරමුදල් මගින් සෘජු ප්‍රධානයන් වශයෙන් ස්වයං රැකියා සඳහා උපකරණ කට්ටල් ලබා ගැනීමට ඒවායේ පිරිවැයෙන් 90% ක් පමණක් ආධාරලාභීන් වෙත ගෙවිය හැකි වූවද, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ආධාරලාභීන් 15 දෙනෙකු වෙත උපකරණ කට්ටලවල මුළු පිරිවැය වූ රු. 398,200 ක් පළාත් සභා ආයෝජන අරමුදලින් ගෙවා තිබුණි. |
| (ii). 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | වයඹ පළාත තුළ සේවයේ නියුතු නලධාරීන් 18 දෙනෙකුගෙන් 1992 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයට අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 952,540 ක් වන අතර, වයඹ පළාත තුළ වෙනත් ආයතනවලින් මාරුවී පැමිණි නිලධාරීන් 11 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 734,020 ක් වූවත් එය 2012 ජුනි 30 දින දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii). සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මනෝ විද්‍යා උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්ය පටිපාටියේ 5:2:1 ජේදයට හා 5:2:1(2) ජේදය | වයඹ රාජ්‍ය සේවා කොමිෂම නිර්දේශ කරන ලද වයඹ පළාත් රාජ්‍ය සේවයේ සුදුසුකම් තහවුරු නොවූ කොන්ත්‍රාත් පදනම මත සේවය කල පුද්ගලයෙකු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සේ සලකා මනෝ විද්‍යා උපදේශක තනතුරු සඳහා බඳවා ගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (iv). | රජයේ ඉඩම් කාර්ය සංග්‍රහය 132 හා 134 | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක හිඟ හිට ඇති දිගු කාලීන හා වාර්ෂික ඉඩම් බදු මුදල් එකතු වටිනාකම රු. 2,682,453 ක් වන නමුත්, හිඟ ගාස්තු අයකර ගැනීමට හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.604,901,992 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.178,191,182 ක් විය.

### 2.2 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආදායම් | | | | | | |
| බදු ආදායම් | 2,714.70 | 3,071.77 | (357.07) | 2,870.00 | 2,321.62 | 548.38 |
| බදු නොවන ආදායම් | 606.30 | 1,298.63 | (692.33) | 740.00 | 626.99 | 113.01 |
| රජයේ ප්‍රදාන | 15,843.44 | 14,680.51 | 1,162.93 | 15,384.50 | 14,280.25 | 1,104.25 |
| එකතුව | 19,164.44 | 19,050.91 | 113.53 | 18,994.50 | 17,228.86 | 1,765.64 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 12,718.26 | 13,452.99 | (734.73) | 12,502.99 | 12,118.32 | 384.67 |
| අනෙකුත් වියදම් | 4,261.16 | 3,102.56 | 1,158.60 | 4,221.85 | 2,903.96 | 1,317.89 |
| උප එකතුව | 16,979.42 | 16,555.55 | 423.87 | 16,724.84 | 15,022.28 | 1,702.56 |
| ප්‍රාග්ධන වියදම් | 2,185.00 | 1,890.47 | 294.53 | 2,469.66 | 2,028.38 | 441.28 |
| එකතුව | 19,164.42 | 18,446.02 | 718.40 | 19,194.50 | 17,050.66 | 2,143.84 |

සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 18,446.02 ක් වූ මුළු වියදමින් 90 % ක් පුනරාවර්තන වියදම් වූ අතර, 10% ක් මූලධන වියදම් විය.

## 2.3 ආදායම් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ 03 ක් සඳහා පළාත් සභාවේ ආදායම් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණ අතර, පසුගිය වර්ෂ 02 ක එම එක් එක් වර්ෂ අවසානයට පැවති හිඟ ආදායම් සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් සමඟ සසඳා පහත දැක්වේ.

| | 2011 | 2010 | 2009 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 5,462,082 | 548,375,620 | 182,981,777 |
| බදු නොවන ආදායම | 16,574,054 | 4,100,006,361 | 31,690,098 |
| එකතුව | 22,036,136 | 4,648,381,981 | 214,671,875 |

(ආ) 2011 ජනවාරි 01 සිට 2011 දෙසැම්බර් 31 දක්වා පළාත් පාලන බල මණ්ඩල 30 කට අදාලව ලැබී තිබූ උසාවි දඩ මුදල් රු. 61,721,041 ක් සහ මුද්දර ගාස්තු රු. 89,755,692 ක් පළාත් පාලන බල මණ්ඩලවලට යවා නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ ඇති වාහන සම්බන්ධව තොරතුරු යාවත්කාලීන කිරීමට පියවර නොගැනීම හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක පමණක් රු. 24,166,826 ක වාහන බලපත්‍ර ආදායම් හිඟ හිට තිබුණි.

## 2.4 අනුමත ප්‍රතිපාදන ඉතිරි කිරීම.

පළාත් සභා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු යටතේ ශීර්ෂ 13 කට අදාලව අවස්ථා 46 කදී වෙන් කර තිබූ මුළු වටිනාකම රු. 7,606,440 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණ අතර, ශීර්ෂ 23 කට අදාලව අවස්ථා 141 දී වෙන් කර තිබූ මුළු වටිනාකම රු. 1,431,544,700 ක් වූ ප්‍රතිපාදන වලින් 25% සිට 99% දක්වා වූ පරාසයකින් යුක්ත ප්‍රතිපාදන ඉතිරි වීම් දක්නට ලැබුණි.

## 2.5 ප්‍රතිපාදන මාරු කිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වයඹ පළාත් සභාවට පරිපූරක මගින් ලබාගත් රු.958,182,400 ප්‍රතිපාදන වලින් 2% සිට 94% දක්වා වූ පරාසයකන් යුක්ත රු.137,173,070 ක මුදලක් පළාත් මුල්‍ය රීත 30 - 32 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබෙන අවස්ථා 10 ක් නිරීක්ෂණය විය.

(ආ) වැය විෂය අංක 231-70-03-1001 යටතේ රු.78,576,000 ක පරිපූරක ප්‍රතිපාදනයක් ලබාගෙන තිබූ අතර, ඊට අතිරේකව 2011 වර්ෂය තුල පරිපූරක ප්‍රතිපාදිත මුදල ඉක්ම වූ රු. 90,665,506 ක මුදලක් පළාත් මුල්‍ය රීති 30 - 32 යටතේද එම වැය විෂය විස්තරයට මාරු කර ගෙන තිබුණි.

## 2.6 අත්තිකාරම් ගිණුම්වල සීමාවන් පිළිනොපැදීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 503 හා වයඹ පළාත සභා මුදල් රීති 369 හි නියමයන්ට පටහැනිව වාණිජ අත්තිකාරම් ගිණුම් විෂයයන් 01ක වියදමෙහි උපරිම සීමාව රු.5,314,774 කින්ද, විෂයයන් 03 ක හර ශේෂයේ උපරිම සීමාව රු. 33,613,214 කින්ද පිළිනොපැද තිබුණි.

(ආ) පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් විෂයයන් 01 ක ලැබීම්වල අවම සීමාව රු. 1,462,402 කින් පිළිපැද නොතිබූ අතර, රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විෂයයන් 41 කට අදාලව වියදමෙහි උපරිම සීමාව රු. 1,134,293 කින්ද ඉක්මවා තිබුණි.

## 2.7 කාරක පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වාණිජ අත්තිකාරම් ගිණුම් 01 ක සමාලෝචිත වර්ෂයේ අනාවරණය වූ කාරක පාඩුව රු. 2,101,064 ක් වූ අතර, පසුගිය වර්ෂ 21 තුළදී දිගින් දිගටම පාඩු වාර්තා වී තිබුණි. පළාත් මුල්‍ය රීති 375 විධිවිධාන අනුව යථෝක්ත කාරක පාඩු ආවරණය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර, අත්තිකාරම් ගිණම් පාඩු පිට පවත්වා ගෙන යාමේ ආර්ථික හා සමාජ සාධාරණත්වය පිළිබඳව කළමණාකාරීත්වය විසින් අවධානය යොමුකර නොතිබුණි.

(ආ) වාණිජ අත්තිකාරම් ගිණුම්වල ඉකුත් වර්ෂයේ අනාවරණය වූ රු. 3,382,494 ක පාඩු සඳහා පළාත් මුල්‍ය රීති 379 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### 2.8.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) <u>පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන</u>

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩුව | (අතිරික්තය) |
|---|---|---|---|---|
| මාණ්ඩලික සහායක | 10,690 | 8,951 | 1,739 | - |
| සුළු සේවක | 6,909 | 5,640 | 1,269 | - |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 1,642 | - | (1,642) |
| එකතුව | 17,599 | 16,233 | 3,008 | (1,642) |

(ආ) <u>පාසැල් කාර්ය මණ්ඩල</u>

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩුව | (අතිරික්තය) |
|---|---|---|---|---|
| විදුහල්පති | 1,430 | 1,069 | 361 | - |
| ගුරු භවතුන් | 23,573 | 23,354 | 219 | - |
| සුළු සේවක | 1,359 | 1,290 | 69 | - |
| වෙනත් | 1,516 | 1,076 | 440 | - |
| අනියම්, තාවකාලික | - | 02 | - | (02) |
| එකතුව | 27,878 | 26,791 | 1089 | (02) |

ඉහත දත්ත පිළිබඳ විගණන නයැදි පරීක්ෂණවලදී පහත සඳහන් කරුණුද අනාවරණය විය.

(i). කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සංවර්ධන සහකාර නිලධාරීන් 03 දෙනෙකු හා වැඩසටහන් සහකාර නිලධාරීන් 03 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ සේවයේ යොදවාගෙන වැටුප් වශයෙන රු. 868,115 ක් ගෙවා තිබුණි.

(ii). ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව පරීක්ෂා කිරීමේදී අනුමැතියකින් තොරව සාමාන්‍ය කම්කරුවන් දෙදෙනෙකු හා මුරකරුවන් 19 දෙනෙකු සේවයේ යොදවා පළාත් සභාවෙන් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 2.8.2 අතිරික්ත මානව සම්පත්

සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක වනිතා කටයුතු ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයෙ අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව වැඩසටහන් සහකාරවරුන් 19 දෙනෙකු සහ මැහුම් උපදේශකවරුන් 08 දෙනෙකු බඳවාගෙන වැටුප් වශයෙන් රු. 231,348 ක් ගෙවා තිබුණි.

## 2.9 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

## 2.9.1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

පහත විග්‍රහ කර ඇති පරිදි භෞතික සම්පත් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් ස්වභාවය | සංඛ්‍යාව/වර්ග ප්‍රමාණය | වටිනාකම | නිෂ්ක්‍රීයව පැවති කාලය වර්ෂ |
|---|---|---|---|
| | | රු. | |
| (අ) ගොඩනැගිලි | | | |
| පරිගණක කාමරය | 01 | 338,073 | අවුරුදු 03 |
| (ආ) කාර්යාල උපකරණ | | | |
| (i). සංගීත උපකරණ | 24 | 199,332 | වර්ෂ 5 ට වැඩි |
| (ii). පරිගණක | 13 | 128,348 | වර්ෂ 1 ට වැඩි |
| (iii). උපකරණ තොගයක් | 01 | 106,840 | වර්ෂ 2 ට වැඩි |
| (ඇ) වෙනත් | | | |
| (i). නල ළිඳක් ඉදිකිරීම | 01 | 388,120 | වර්ෂ 2 ට වැඩි |
| (ii). බෝට් මැෂින් | 19 | 194,750 | වර්ෂ 1 ට වැඩි |
| (iii). සී.එෆ්.එල්. බල්බ | 1502 | 351,468 | වර්ෂ 1 ට වැඩි |
| (iv). ධීවර ආම්පන්න තොග | 01 | 6,934,870 | වර්ෂ 1 ට වැඩි |
| (v). ජල ව්‍යාපෘතිය | 01 | 229,814 | වර්ෂ 1 ට වැඩි |
| | | 8,871,615 | |

(ඈ) වයඹ පළාතේ රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අනුබද්ධව ඉදිකර තිබෙන නිල නිවාස 40 ක් පාවිච්චියට ගැනීමකින් තොරව වසර 10 කට වැඩි කාලයක සිට වසා දමා තිබුණි.

(ඉ) අංක A/26-667852 දරන නිකුත් කිරීම් නියෝගයෙන් 2006 වර්ෂයේදී දඹදෙණිය රෝහලට ලැබී තිබෙන ළමා ඇඳන් සහ රබර් මෙට්ට 14 ක් 2011 ජුලි 05 දින වන විටද භාවිතයට ගෙන නොතිබුණු අතර, වෙනත් රෝහල්වලට හෝ ලබා දීමට කටයුතු කර නොතිබුණි.

**2.9.2 වෙනත් ආයතනවලින් ලබාගෙන ඇති භෞතික සම්පත්**

කඩා කාර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් වඩු කර්මාන්ත මධ්‍යස්ථාන 15 ක්, කොහු මධ්‍යස්ථාන 17 ක්, ඉංජිනේරු මධ්‍යස්ථාන 04 ක්, මැටි කර්මාන්ත මධ්‍යස්ථාන 05 ක් සහ ජනකලා මධ්‍යස්ථාන 01 ක්ද වශයෙන් පිහිටුවා ඇති මධ්‍යස්ථානවලට වැඩිදියුණු කිරීම් හා ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලැබූවත් එම මධ්‍යස්ථාන පිහිටුවා ඇති ඉඩම්, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.9.3 සමීක්ෂණය නොකළ වත්කම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් මුල්‍ය රීති 476 අනුව පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 04 ක සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

(ආ) දඹදෙණිය මූලික රෝහලේ ඖෂධ ගබඩාවේ 2011 ජුලි 05,06 හා 07 දිනයන්හිදී සිදුකල විගණන පරීක්ෂාවට අනුව රු. 617,262 ක් වටිනා ඖෂධ වර්ග 43 ක ඌණතාවයක් සහ රු. 41,244 ක වටිනා ඖෂධ අයිතම් 27 ක අතිරික්තයක් සහ රු. 67,498 ක් වටිනා ශල්‍ය වෛද්‍ය උපකරණ වර්ග 08 ක ඌනතාවයක් සහ රු. 11,429 ක් වටිනා වර්ග 03 ක අතිරික්තයක්ද අනාවරණය විය.

**2.9.4 ලැබිය යුතු ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ ආයතන 03 කට අදාල ශේෂයන් 05 ක වටිනාකම රු. 26,616,865 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 1,274,827 ක් විය.

**2.9.5 නිරවුල් නොකළ අත්තිකාරම්.**

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 2008 වර්ෂයට අදාලව 2010 සැප්තැම්බර් 21 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබෙන පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමට අනුව, ස්ථාන මාරුවී පැමිණි, ස්ථාන මාරු වී ගිය, සේවය අතහැර ගිය, මියගිය සහ විශ්‍රාම ලැබූ කාර්ය මණ්ඩලයේ

නිලධාරීන්ගෙන් පිළිවෙලින් රු. 50,026,962, රු. 28,969,041, රු. 423,085 ක් සහ රු. 677,614 ක් වූ ණය ශේෂ නිරවුල් කර ගෙන නොතිබුණි.

**2.9.6 අයවීමට ඇති සේවක ණය.**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 2,923,350 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු. 993,689 ක් විය.

(ආ) පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ සේවය පහකල එක් නිලධාරියෙකුගෙන් පිළවෙලින් අය විය යුතු රු. 147,150 ක් සහ රු. 212,300 ක් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම, ගිණුම්ගත කිරීමේදී, පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ණය පාලන ගිණුම් අනුව එම අගය රු. 662,836 ක් වූ අතර, පළාත් මුල්‍ය රීති 368 ප්‍රකාර හර බැර ශේෂ ගැලපීම් සටහන පරිදි එම අගය රු. 745,106 ක් වූයෙන් රු. 82,270 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 1992 වර්ෂයේ සිට 2010 දක්වා කාලය තුළ පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයෙන් වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 224 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදල් ශේෂයන්ගේ එකතුව රු. 3,069,927 ක් වන අතර, වෙනත් දෙපාර්තමේන්තුවලින් පැමිණි නිලධාරීන් 78 දෙනෙකු වෙනුවෙන් ඒ ඒ දෙපාර්තමේන්තු වෙත ගෙවිය යුතු ණය ශේෂ වල එකතුව රු. 3,501,315 ක් වූවත් ඒවා 2012 ජූලි 31 දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.10 හඳුනාගත් පාඩු හා හානි**

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී සහ ආයතනයේ පවත්වා තිබූ තොරතුරු අනුව පහත සඳහන් පාඩු හා හානි අනාවරණය වී ඇත.

(අ) කුඩාකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් ආයතන 2 ක වාර්ෂික බදුකුලී සහ සිදුවූ අලාභ හේතුවෙන් පිළිවෙලින් රු.960,030 ක හා රු.4,858,720 ක් අයවීමට තිබුණි.

(ආ) වැලි කැණීම් සඳහා වූ රාජ්‍ය භාග වලින් වයඹ කෘෂිකර්ම අමාත්‍යාංශයට අයවිය යුතු රු.33,762 ක් 2011 දෙසැම්බර් 31 දින දක්වා අයකරගෙන නොතිබුණි.

(ඇ) විගණනයේදී නියැදි පරීක්ෂාවට ලක්කල වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් කුරුණෑගල ගබඩාවේ සහ රෝහල් 2 ක රු.21,969,201 ක් වටිනා කල් ඉකුත් වූ තොග 125 කට අයත් ඖෂධ හා ශෛල්‍ය වෛද්‍ය උපකරණ ඒකක 1,391,407 ක් හා නියැදි අසාර්ථකවීම් මත රු.35,334 ක් වටිනා ඖෂධ තොග ඒකක 55172 ක් ගබඩාවේ තබා තිබුණ අතර, අංක 41-5440 දරන ගිලන් රථයේ ටයර් පද්ධතිය මුළුමනින්ම ගිනි ගැනීම හේතුවෙන් රු.473,050 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඈ) පරගම්මන සුදු කොහු සමාගමට සහ පන්නල නොර්කාතේ සමාගමට බදු දී ඇති ඉඩම් වලින් අයකරගත යුතු එකතුව රු.98,576 ක් වටිනා එළදාබදු පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් 2011 දෙසැම්බර් 31 දින දක්වා අයකරගෙන නොතිබුණි.

## 2.11 දාශ්‍ය වංචනික ගනුදෙනු

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් පාවහන් මිලදී ගැනීම සඳහා එක් ක්‍රීඩකයකුට රු. 14,500 බැගින් ගෙවීම සඳහා පිළියෙල කර තිබුණු පොදු 35 ගෙවීම් වවුචර් 10 ක සඳහා රු. 145,000 ක මුදල මුලස්ථාන කඩා නිලධාරී විසින් එම ගෙවීම් වවුචර්වලට ව්‍යාජ අත්සන් තබා ලබාගෙන තිබුණි.

(ආ) කුරුණෑගල ශ්‍රීමත් ජෝන් කොතලාවල මහා විද්‍යාලයේ සීමාවාසික ගුරුවරියකගේ ව්‍යාපෘතියක් වශයෙන් අලුත්වැඩියා කර තිබූ සංගීත කාමරය නැවතත් අලුත්වැඩියාව සඳහා 6 - 11 වසර සංගීත ගුරුමහත්මිය විසින් අනුමැතියකින් තොරව එක් සිසුවකුගෙන් රු. 200 බැගින් රු. 18,800 ක මුදලක් එකතු කර අත රදවාගෙන තිබුණි.

(ඇ) කුලියාපිටිය කලාපයේ බැමිණිගල්ල ශ්‍රී සද්ධා විමල කනිටු විදුහලේ 60 x 25 පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල ඇස්තමේන්තු අයිතම අංක 11 සිට 16 දක්වා කොටස දෙමව්පියන් විසින් ඉටුකර තිබියදීත්, ඒ වෙනුවෙන් රු. 38,345 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඈ) ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ අත්තිකාරම් ලේඛණය අනුව තිබිය යුතු මුදල් ශේෂය රු. 93,942 ක් වුවද අතැති මුදල් ශේෂය ලෙස රු. 48,817 ක් විගණනයට ඉදිරිපත් කිරීමෙන් රු. 45,125 ක ඌනතාවක් නිරීක්ෂණය විය.

## 2.12 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පහත සඳහන් අවස්ථාවන් නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දින වවුචර් අංක 639 යටතේ කුලියාපිටිය මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව තාර ලීටර් 58600 ක් රු. 5,361,900 ක වියදමක් දරා මිලදී ගෙන තිබුණද මිලදී ගැනීමට පෙර අවශ්‍යතාවයන් හඳුනා ගැනීමක් සිදුකර නොතිබීම නිසා 2012 පෙබරවාරි 10 දින වන විටත් ගබඩාව තුල රඳවා තිබුණි.

(ආ) නිකවැරටිය කලාප අධ්‍යාපන කාර්යාලය 2010 වර්ෂය සඳහා නිල ඇඳුම් ඇනවුම් කිරීමේදී නිසි අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම නිසා 2010 වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ නිල ඇඳුම් කට්ටල 8783 ක් 2011 නොවැම්බර් 16 දින වන විටත් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත්ව තිබුණු උදනට වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරාගෙන තිබෙන නිල නිවස නියමිත පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් පදිංචියට සුදුසු තත්ත්වයක නොමැති බව සඳහන් කරමින් විෂයභාර අමාත්‍යවරයාට වාර්ෂිකව රු. 300,000 ක බදු කුලී පදනමට නිවසක් ලබා ගෙන තිබුණි.

(ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව රු. 1,318,605 ක මුදලක් වැයකර කුරුණෑගල කලාපයේ පාසල් 3 කට පිළිවෙලින් 2011 පබරවාරි 17 සහ 2011 පෙබරවාරි 08 පරිගණක හා උපාංග කට්ටල 14 බැගින් ලබා දී තිබූ අතර, එයින් පරිගණක කට්ටල 04 ක් 2011 දෙසැම්බර් 31 දින වන විට අක්‍රීයව පැවතුනි.

(ඉ) 2011 දෙසැම්බර් 31 දිනට පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයේ සරප් නමින් ලියන ලද රු. 281,283 ක් වටිනා චෙක්පත් 19 ක් 2012 ජනවාරි 13 විගණන දිනවන විටත් මුදල් කරගෙන නොතිබුණි.

## 2.13 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 ඡේදය පරිදි විශ්‍රාමික නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක වනිතා කටයුතු ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය ඊට පටහැනිව, හිටපු ලේකම්වරයා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව නැවත සේවයේ

යොදවා ගෙන වැටුප්, දීමනා හා නිවාඩු දින වැටුප් වශයෙන් රු. 109,154 ක් ගෙවා තිබූ අතර, පළාත් සභා ලේකම් කාර්යාලයේ විශ්‍රාම ගිය නිලධාරියකු නැවත සේවයේ යොදවාගෙන වැටුප් හා ඉන්ධන දීමනා වශයෙන් රු. 134,634 ක් ගෙවා තිබුණි.

(ආ) උපහාර ලබන පුහුණුකරුවෙකුට ගෙවීමට අනුමත කර තිබුණු මුදල රු. 9,000 ක් වුවද, ගෙවීම් ලේඛණයට අනුව රු. 19,000 ක මුදලක් සෞඛ්‍ය දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි.

(ඇ) සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය 2011 මැයි 09 වන දින පවත්වන ලද ජාතික තැලසීමියා උත්සවයේ වේදිකාව මෙහෙයවීමේ සහ නිවේදන කටයුතුවලට තෝරාගෙන තිබුණු නිවේදකට එම කාර්යය සඳහා ප්‍රසම්පාදන මණ්ඩල තීරණය අනුව ගෙවීමට එකඟ වී තිබුණු රු. 50,000 ක මුදලට අමතරව රු. 25,000 ක් වශයෙන් එකතුව රු. 75,000 ක් ගෙවා තිබුණි.

(ඈ) වයඹ මාර්ග සංවර්ධන, විදුලිබල, නිවාස හා ඉදිකිරීම් සහ ධීවර කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය තුළ අනුමත නොවූ කාර්ය මණ්ඩල නිලධාරීන් 06 දෙනෙකු යොදවාගෙන රු. 2,166,605 ක මුදලක් වැටුප් වශයෙන් 2011 වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඉ) 2011 ජුලි 05 දිනට දඹදෙණිය රෝහලේ මුදල් භාරකරු අත ඉතිරිව තිබූ මුදලින් රු. 34,928 ක මුදලක් නියමිත ලදුපත් නිකුත් කිරීමකින් තොරව එකතු කරගෙන තිබුණු අතර, ඒ සඳහා වූ විධිමත් අනුමැතියක් අදාල අමාත්‍යාංශ ලේකම්ගෙන් හෝ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගෙන් ලබාගෙන නොතිබුණි.

(ඊ) වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතියකින් තොරව කුරුණෑගල ශ්‍රීමත් ජෝන් කොතලාවල මහ විද්‍යාලයේ 1 - 5 ශ්‍රේණි ළමයිනගෙන් රු. 343,200 ක මුදලක් ලදුපත් නොමැතිව එකතු කර තිබුණි.

(උ) වයඹ පළාත් ක්‍රීඩා අරමුදල මගින් දිරි දීමනා හා අනුග්‍රහ දීමනා වශයෙන් රු. 188,500 ක් ගෙවා තිබෙන අතර, එම දීමනාවේ එක් එක් ක්‍රීඩකයෙකු සඳහා ගෙවන මුදල තීරණය වීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තියක් පිළියෙල කර අනුමත කරවාගෙන නොතිබුණි.

(ඌ) ආණ්ඩුකාර නිල නිවස වටා දැල් වැටක් ඉදිකිරීම වෙනුවෙන් 2011 ජුලි 01 දින රු. 329,425 ක්ද, විදුලි ජනක යන්ත්‍රය සවි කිරීම සඳහා ආවරණයක් සකස් කිරීම සඳහා 2011 දෙසැම්බර් 07 දින රු. 321,818 ක්ද, ඇතුලුව එකතුව රු. 651,270 ක් 201-03-01-2004 වැය ශීර්ෂයෙන් වැය කර තිබුණද, මෙවැනි වැය ශීර්ෂයක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවේ ප්‍රතිපාදන වෙන් කර නොතිබුණ අතර, පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 01 වැනි පරිච්ඡේදයේ 24:3 හා 24:4 වගන්තිවලට අනුව ඇස්තමේන්තු සංශෝධනය කරගෙන නොතිබුණි.

2.14 **අවිධිමත් ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුලියාපිටිය මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව 2011 ජුලි 25 දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති FC/PCG හා CBG/Circular 2011/1 චක්‍රලේඛයෙහි 6 (8) ජේදයට අනුකූල නොවන පරිදි තාවකාලික වැඩ පරිපාලකවරුන් බඳවා ගෙන 2011 දෙසැම්බර් 31 දිනට රු. 254,000 ක ගෙවීමක් සිදු කර තිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශයේ වාර්ෂික සැලැස්මේ ප්‍රතිපාදිත වෙන් නොවූ මාර්ග 25 ක කි.මී. 6.7 ක දුරක් සංවර්ධනය සඳහා රු. 8,390,146 ක මුදලක් වර්ෂය තුළ වැය කර තිබුණි.

(ඇ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව 2011 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී මිලදී ගැනීම සඳහා ඇණවුම් භාරදී තිබෙන වටිනාකම රු. 3,479,929 ක් වූ වෛද්‍ය උපකරණ 2012 අගෝස්තු මාසය වන විටද ලැබී නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිල වාහනය සඳහා අනුමැතියකින් තොරව අනුමත සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන ලීටර් 2002 ක් ලබාගෙන තිබුණි.

2.15 **මතභේදයට තුඩුදෙන ගණදෙනු**

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ මතභේදයට තුඩුදෙන හෝ ප්‍රශ්ණකාරී ස්වරූපයක වූ ගණදෙනු පහත දැක්වේ.

(අ) වයඹ ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික ලේකම් සේවය නොකරනු ලැබූ 2010 දෙසැම්බර් මස සිට 2011 දෙසැම්බර් මස දක්වා වූ කාල පරිච්ජේදය සඳහා දීමනා වශයෙන් රු. 177,028 ක් ගෙවා තිබුණි.

(ආ) 2001 අප්‍රේල් 01 දින සිට 2009 මාර්තු 31 දක්වා කාලය තුළදී මිලියන 04 ක පමණ මුල්‍ය වංචාවක් සිදුවී තිබෙන සමිතියක වර්ෂ 08 හි ගිණුම් සමුපකාර කොමසාරිස් විසින් නිවැරදි බව සහතික කර තිබුණි.

(ඇ) සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ කටයුතු සඳහා අවශ්‍ය පරිගණක මෘදුකාංගයක් පිළියෙල කිරීමට වෙනත් ආයතනයක් සමඟ රු. 672,000 ක වටිනාකමට ගිවිසුම්ගතව තිබූ නමුත් අදාල ගිවිසුම්ගත කාලය අවසන්ව තිබුණද, පිළියෙල කර තිබෙන

පරිගණක වැඩසටහනේ සමහර කාර්යයන් 2012 අප්‍රේල් මාසය වන විටද ක්‍රියාතමක කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2010 ජනවාරි 01 දින සිට ප්‍රධාන අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරිවරයා 2011 ඔක්තෝබර් 07 සිට 2011 නොවැම්බර් 25 දක්වා වැටුප් රහිත නිවාඩු මත විදේශගත වී තිබුණද සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය එම කාලයට අදාලව රු. 50,928 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඉ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව බීජ රටකජු කිලෝ ග්‍රෑම් 10,000 ක් මිලදී ගැනීම සඳහා ඔඩ්ඩු සුඩාන්හි පදිංචි සැපයුම්කරුවෙකුහට රු. 1,649,500 ක් ගෙවා තිබූ අතර, මුලතිව් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණේ ගොවි නිවෙස්වලින් බීජ එක් රැස් කිරීම සඳහා අත්තිකාරම් ලෙස රු. 495,000 ක් සැපයුම්කරුහට ගෙවා තිබෙන බවකි.

(ඊ) වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්ථාපිත කාර්යයන්හි නිරත වූ නිලධාරීන්හට අයදුම්පත් කැඳවා විභාග පැවැත්වීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් වෙත අදාල අයදුම්පත් උපලේඛණගත කොට ඉදිරිපත් කිරීමේ කටයුතු සඳහා එක් අයදුම්පතකට රු. 25 බැගින් දිරි දීමනාවක් ආණ්ඩුකාරතුමාගෙන් අනුමත කරගෙන රු. 423,700 ක මුදලක් 2011 වර්ෂය තුළ ගෙවා තිබුණි.

(උ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කල තනතුරු සංඛ්‍යාව ඉක්මවා දෙදෙනෙකු සේවයේ යොදවා ගෙන 2010 හා 2011 වර්ෂවල පිළිවෙලින් රු. 141,786 ක් හා රු. 561,626 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි.

(ඌ) මහවැව ප්‍රාදේශීය මහ ලේකම් බල ප්‍රදේශයේ පිහිටි 1968 වර්ෂයේ මිනුම් කරන ලද මුලික පිඹුරු අංක 190 යටතේ රජයට අයත් මාදංගහවත්ත ඉඩමේ පර්චස් 52.6 ක ප්‍රමාණයක් 1982 වර්ෂයේ සිට පෞද්ගලික ආයතනයක් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් සිටින අතර, එම දේපල විධිමත් ලෙස පවරා බදු මුදල් අය කර ගැනීමට හෝ සන්තකය ආපසු ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(එ) මහවැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හැවන ග්‍රාමයේ පිහිටි රජයේ ඉඩමක සීමාරහිත හැවන වතුගහමුල්ල සණස සමිතිය විසින් මීට වසර 18 කට පෙර අනවසරයෙන් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර, එම දේපල විධිමත් ලෙස බදුදී බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) මහවැව ප්‍රදේශීය මහ ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ තොඩුවාව ගමේ පිහිටි රජයට අයත් අක්කර 30 ක් විශාල දික්ඕඩය ඉඩමෙන් අක්කර 10 පර්චස් 12 ක් අංක 4/10/14231 දරණ බදු

ඔප්පුව පිට 1992 ජනවාරි 01 දින සිට වසර 30 ක් සඳහා ඉස්සන් වගාව සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයකුට බදුදී තිබුණද, ඉඩම තක්සේරු කර, තක්සේරු වටිනාකමින් 4% ක් වූ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ සඳහා වූ මිනුම් ගාස්තු ද බදුකරුගෙන් අයකරගෙන නොතිබුණි.

(ඔ) කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහනවලින් තෝරාගත් වාහන කීපයක දෛනික ධාවන සටහන්වල සඳහන් වේලාවන් සහ මුරකරුගේ ගේට්ටු සටහන් පොත්වල සඳහන් වේලාවන් සමඟ නොසසඳා සංයුක්ත දීමනා හා අතිකාල දීමනා ගෙවා තිබීම හේතුවෙන් 2011 අගෝස්තු 04 දිනැති අංක 10 දරන වවුචරයෙන් පමණක් රු. 92,479 ක් සංයුක්ත දීමනා හා අතිකාල දීමනා වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි.

(ඕ) පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංවර්ධන යෝජනා සඳහා වූ ප්‍රතිපාදන මුදල් මගින් අවස්ථා 07 කදී රු.213,250 ක කාර්යාල උපකරණ ඇතුළුව උපකරණ රජයේ කාර්යාල සඳහා සපයා දී තිබුණි. අදාල ආයතනවල වැය ශීර්ෂවලින් මේ සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතු වුවද, මහජන අභිවෘද්ධිය සඳහා ඇති පළාත් සභා මූලධන ප්‍රතිපාදනවලින් වැය කටයුතු සිදුකර තිබුණි.

## 2.16 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක වනිතා කටයුතු ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය 2011 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ වයඹ ගැමි සවිය ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන වැඩසටහන සඳහා වැය කරන ලද රු.601,568 මුලු මුදලින් 65% ක් ආහාර සඳහාද, 19.6% ක් දේශන ගාස්තු සඳහාද, 15.4% ක් අනෙකුත් ගමන් වියදම් හා රියදුරු දීමනා සඳහාද වියදම් දරා තිබුණි.

(ආ) උසාවියෙන් අයකරගත් මුදලින් රාජකාරි කටයුතු කළ නිලධාරීන්ට ගෙවීම සඳහා 2008 ඔක්තෝබර් සිට 2010 දෙසැම්බර් තෙක් රඳවාගත් රු. 556,008 ක මුදලක් අදාළ නිලධාරීන්ට ගෙවීමට පළාත සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් අයකල රාජ්‍ය භාගය රජයේ/ පළාත් සභා අරමුදලට බැර කළයුතු වුවත්, 2005 ජනවාරි 01 දින සිට 2011 මැයි 31 දක්වා එකතු කර තිබුණු රු. 340,236 ක් වූ රාජ්‍ය භාගය පළාත් සභා අරමුදලට බැර කර නොතිබුණි.

(ඈ) පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා 2000 සිට 2010 අතර කාලය තුළ තෝරාගෙන තිබුණු ආයුර්වේද වෛද්‍යවරුන් 17 දෙනෙකුගේ පාඨමාලා ගාස්තු වශයෙන් රු. 879,850 ක මුදලක් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් ගෙවා තිබුණු අතර, එම වෛද්‍යවරුන් විසින් අදාල සහතිකපත් 2012 අගෝස්තු මාසය වන විටද ඉදිරිපත් කර නොතිබීම තුළ අදාල මුදල් ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) වයඹ පළාත තුළ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ප්‍රචලිත කර්මේ ව්‍යාපෘති යටතේ 2011 වර්ෂය තුළ සිදු කිරීම සඳහා ව්‍යාපෘති 603 ක් සැලසුම් කර තිබුණද, වර්ෂය අවසානයට ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

(ඊ) පුත්තලම නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් රෝහල් 04 කට අනුයුක්ත ලියාපදිංචි හා සහකාර වෛද්‍ය නිලධාරීන් 04 දෙනෙකු රාගම රෝහලේ පැවති විෂයානුබද්ද න්‍යායාත්මක පාඨමාලාවකට සහභාගී වීම සඳහා වැටුප් සහිතව නිදහස් කර තිබියදී එම පාඨමාලාව නොපැවැත්වීම හේතුවෙන්, 2010 ජනවාරි 18 දින සිට 2011 මැයි 05 දින දක්වා වූ නැවත සේවයට වාර්තා නොකල කාලසීමාව වෙනුවෙන් ඔවුන් වෙත වැටුප් හා දීමනා වශයෙන් රු. 1,128,864 ක් ගෙවා තිබුණි.

(උ) වයඹ මාර්ග සංවර්ධන, විදුලිබල, නිවාස හා ඉදිකිරීම් සහ ධීවර කටයුතු අමාත්‍යාංශය විසින් පළාතේ ජනතාවගේ ජීවන වෘත්තීන් පහසුකරවනු වස් ක්‍රියාත්මක කරන ලද විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා පහසුකම් ලබාදීමේ වැඩසටහන සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 17 දෙනෙකු හා පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 24 දෙනෙකු වෙනුවෙන් රු. 677,320 ක් වටිනා දැල් 41 ක් ලබාදී තිබුණි. ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය අනාවරණය කිරීමට නිලධාරීන්ට නොහැකි වුණි.

(ඌ) කුලී අයවන නිල නිවාස 18 ක් කුලී ඇතුලුව ප්‍රයෝජනයට ගන්නා නිල නිවාස 41 ක් ඇති බව වාර්තා වූවද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2012 මාර්තු 20 දින වන විටත් නිල නිවාස තක්සේරු කර කුලී මුදල් නියම කිරීම හා කුලී ගිවිසුම්වලට එළඹීම යාවත්කාලීනව සිදුකර නොතිබුණි.

(එ) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධි ශීතකරණ මිලදී ගැනීමේදී වැඩි මිල තෝරා ගැනීමේ හේතුවෙන් ශීතකරන 50 ක් සඳහා රු. 80,000 ක් වැඩිපුර ගෙවා තිබූ අතර, 2012 මැයි 15 දින වන විටත් අදාල කාර්ය සඳහා යොදාගෙන නොතිබුණි.

(ඒ) සත්ව නිෂපාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව අංක 40 - 7371 දරන වාහනය රු. 444,940 ක මුදලකට අලුත්වැඩියා කිරීම පිණිස ගිවිසුමකින් තොරව පෞද්ගලික ගරාජයකට 2009 ජුලි 10 දින භාරදී තිබූ අතර, අලුත්වැඩියාව නිමකර වාහනය 2011 නොවැම්බර් 27 දින ආපසු භාරගන්නා විට ගත වී ඇති කාලය අවුරුදු 2 යි මාස 04 ක. එමෙන්ම අලුත්වැඩියා කර්මේදී වාහනයෙන් ඉවත් කරන ලද කොටස් ආපසු ගබඩාවට ලබාගෙනද නොතිබුණි.

(ඔ) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පළාත් මුල්‍ය රීති 471.1 හි විධිවිධානවලට අනුකූල නොවන ලෙස 2011 පළාත් සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව ලද රු. 2,014,025 ක් වටිනා භාණ්ඩ 2012 පෙබරවාරි 13 දින වන විටත් ගබඩා ලේඛණවල සටහන් කර නොතිබුණි.

(ඕ) කුලියාපිටිය මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු විසින් 2011 දෙසැම්බර් 31 දින ටයර් මිලදී ගැනීම සඳහා රු. 181,450 ක් ගෙවා තිබුණද, 2012 ජනවාරි 30 දින වන විටත් අදාල භාණ්ඩ දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.

(ක) 2010 වර්ෂයේදී රු.153,945 ක් වූ වියදමට සාපේක්ෂව 2011 වර්ෂයේදී රු.171,860 ක මුදලක් බරවා, ලාදුරු සහ මීඋණ රෝග නිවාරණ කටයුතු සඳහා වියදම් කර තිබුණු නමුත්, වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් 11 සිට 23 දක්වාත් 127 සිට 161 දක්වා සහ 383 සිට 1456 දක්වා වැඩිවී තිබුණු අතර, මීඋණ රෝගයෙන් සිදු වූ මරණ සංඛ්‍යාව 1 සිට 18 දක්වා වැඩිවී තිබුණි.

(ග) රු. 169,000 ක වටිනාකමකට ධ්‍රැව 4 ක් සම්බන්ධතා උපකරණ (4 Pole Contractors) 2 ක් මිලදී ගැනීම අවිධිමත් බව පෙන්වා දීමෙන් පසු පරීක්ෂාවට නලධාරියෙකු පත්කර තිබූ අතර, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ වාර්තා මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

(ජ) ප්‍රමාණවත් ඇපකර ලබා නොගෙන කොන්ත්‍රාත් පිරිනැමීම හේතුවෙන් රු. 12,981,947 ක් වටිනා සැපයීම්වල දක්නට ලැබෙන අඩුපාඩුවලට අදාල අලාභ අයකර ගැනීමට හෝ භාණ්ඩ ආපසු යැවීමට හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පැවැත්විය යුතු විභාග දර්ශනය අනුව විභාග 41 ක් පැවැත්වීමට නියමිතව තිබුනද පවත්වා තිබුණේ විභාග 11 ක් පමණි. විභාග 30 ක් පවත්වා නොතිබුණි.

(ඩ) 2011 වර්ෂය සඳහා පුත්තලම අධ්‍යාපන කලාපයේ සිසුන් 262 දෙනෙකුට මාස 01 සිට 08 දක්වා කාලපරිච්ඡේදයට අදාලව ගෙවිය යුතු ශිෂ්‍යත්ව ආධාර මුදල රු. 385,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා නොතිබුණි.

## 2.17 පාසල් පරිපාලන දුර්වලතා.

පහත සඳහන් කරුණු නියැදි පරීක්ෂා අනුව නිරීක්ෂණය කෙරේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 1982 මාර්තු 30 දිනැති අංක 1982/02, 2005 පෙබරවාරි 03 දිනැති අංක 1/2005, 2008 සැප්තැම්බර් 15 දිනැති 2008/35, 2009 මැයි 26 දිනැති 2009/18, 2010 මැයි 31 දිනැති 2010/21 යන චක්‍රලේඛවලට අනුකූල නොවන ලෙස පාසැල්

විසින් සමාලෝචිත වර්ෂයේ කටයුතු කල ගණුදෙනුවල වටිනාකම රු. 2,513,247 ක් වී තිබූ අතර, එක් පාසලක් පමණක් අනුමත සීමාව ඉක්මවා සිසුන් සංඛ්‍යාව 19 ක් ඇතුළත් කර ගෙන තිබුණි.

(ආ) මානව සම්පත් සංවර්ධන අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස කටයුතු කළ ආයතන පහත පරිදි විය.

(i). ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ පාසල් 109 කට අදාල ගුරුවරුන් 636 කින් 441 දෙනෙකු නියමිත කාලච්ඡේද උගන්වා නොතිබුණි.

(ii). පුත්තලම කලාප කාර්යාලයේ එක් පාසැලක අතිරේකව ගුරුවරුන් 03 දෙනෙකු රඳවාගෙන තිබුණි.

(iii). මහව ගජනැග්ගම විදුහලෙහි පංති 7 කට අදාලව ඉගැන්විය යුතු කාලච්ඡේද 570 න් 352 ක් උගන්වා නොතිබුණ නමුත් අතිරික්ත ගුරුවරුන් ගණන 06 ක් විය.

(iv). හලාවත අධ්‍යාපන කලාපයට අයත් පාසල් 05 ක ගුරුවරුන් 06 දෙනෙකුට රාජකාරි නොපවරා 2010 ජනවාරි සිට 2011 මැයි දක්වා රු. 1,964,165 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(v). ශ්‍රීමත් ජෝන් කොතලාවල මහා විද්‍යාලයේ ගුරුවරුන් 84 දෙනෙකුට සතියකට කාලච්ඡේද 324 ක් අධ්‍යයන නොවන වෙනත් ක්‍රියාකාරකම් පවරා තිබුණි.

(vi). මැදමුල්ල, ද මැල් නවෝද්‍යා විද්‍යාලයේ ගුරුවරුන් 30 දෙනෙකු සතියකට ඉගැන්විය යුතු කාලච්ඡේද 945 ක් වුවත් කාලච්ඡේද 326 ක් සඳහා කාලසටහන් ලබා දී නොතිබුණි.

(vii). පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත ගුරු උපදේශකවරුන් 58 දෙනා කොට්ඨාශ කාර්යාලවල පිහිටි දුෂ්කර පාසැල් සඳහා තම සේවය ලබා දී නොතිබුණි.

(viii). වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතයකින් තොරව ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාලය රු. 1,809,905 ක්ද මැද මුල්ල, ද මැල් විද්‍යාලය රු. 110,000 ක්ද එකතු කර තිබුණි.

(ix). කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ කොට්ඨාශය තුළ පිහිටි පාසල් 169 න් ශිෂ්‍ය සංඛ්‍යාව 0 - 100 අතර මට්ටමක සිටින පාසැල් ගණන 60 කි.

(x). මලගනේ සරස්වතී විද්‍යාලයේ පරිගණක කාමරය දූවිල්ලෙන් වැසී පැවති අතර, වැසි දිනවලදී ජලය ඇතුළට කාන්දු වන බවද නිරීක්ෂණය විය.

(xi). මැද මුල්ල, ද මැල් නවෝද්‍යා විද්‍යාලයේ ගුරුවරුන් 04 දෙනෙකු අනුමැතියකින් තොරව නිවාඩු දින 148 ක් ලබාගෙන තිබුණි.

(xii). නිකවැරටිය අධ්‍යාපන කලාපයේ ප්‍රතිඵල සනාථ වී නොමැති හා සාමාන්‍ය පෙළ ගණිතය අසමත් ගුරුවරුන් සංඛ්‍යාව 222 ක් විය.

(ඇ) චක්‍රලේඛ අංක 2006/20 හා 2008/21 ප්‍රකාරව 2 - 5 ශ්‍රේණි දක්වා ඇතුළත් කල හැකි සිසුන් සංඛ්‍යාව 40 කටත්, 6 - 11 ශ්‍රේණි දක්වා පංතියකට ඇතුළත් කළ හැකි සිසුන් සංඛ්‍යාව 45 කටත්, සීමා කළ යුතු වූවත් කුරුණෑගල ශ්‍රීමත් ජෝන් කොතලාවල මහා විද්‍යාලය 2011 ජුනි 22 වන විට පංති 40 කට අදාලව අනුමත සීමාව ඉක්මවා සිසුන් 237 දෙනෙක් ඇතුළත් කරගෙන තිබුණ අතර, ඉබ්බාගමුව මැද මුල්ල ද මැල් විද්‍යාලයේ පංති 17 ක් සඳහාද අනුමත සීමාව ඉක්මවා ළමුන් 107 දෙනෙකු 2011 නොවැම්බර් 20 දින වන විට ඇතුළත් කර ගෙන තිබුණි.

(ඈ) කුරුණෑගල ශ්‍රීමත් ජෝන් කොතලාවල මහා විද්‍යාලයේ රු. 1,466,705 ක වටිනාකමකින් යුතු ඉදිකිරීම් හා අලුත්වැඩියා 4 ක් සම්බන්ධයෙන් අනුමැතිය නොලබා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව බාහිර පුද්ගලයන් ලවා මුදල් එකතු කර ගෙවීම් සිදුකර තිබුණි.

## 2.18 පළාත් ගිණුම් කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම

2011 නොවැම්බර් 29 දිනැති පළාත් ගිණුම් කාරක සභා රැස්වීම් වාර්තාවේ 4.2 ජේදය ප්‍රකාරව නිල නිවාස කුලී අයකිරීමට අදාලව ආර්ථික කුලිය අය කිරීමේ නියෝග ලබා දිය යුත්තේ අමාත්‍යාංශ ලේකම් විසින් බවත, එයද එක් වසරක් සඳහා පමණක් විය යුතු බවත් සඳහන්ව තිබුණද, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.19 කාර්ය සාධනය

### 2.19.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැයකිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රතිපාදනය | වියදම | ඌන උපයෝජනය |
|---|---:|---:|---:|
| | රු. | රු. | රු. |
| (i). උපමාන පාදක ප්‍රදාන | 330,000,000 | 287,380,270 | 42,619,730 |
| (ii). පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,575,000,000 | 1,339,492,691 | 235,507,309 |
| (iii). සාමූහික ප්‍රදාන | 16,855,436,000 | 16,551,642,819 | 303,793,181 |
| (iv). වෙනත් ප්‍රදාන | 244,000,000 | 118,429,848 | 125,570,152 |

### 2.19.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම අනුව නව වැඩ හා අඛණ්ඩ වැඩ සඳහා අගය රු. 1,754,150,000 ක වූ වැඩ යෝජනා 4886 ක් අනුමත කර තිබුණි. එම වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අඛණ්ඩ වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| (අ) සම්පූර්ණයෙන් නිමකල | 4795 | 62 | 4857 |
| (ආ) 50% කට වඩා අඩුවෙන් නිමකල | - | - | - |
| (ඇ) 50% කට වඩා වැඩියෙන් නිම කල | 17 | - | 17 |
| (ඈ) ආරම්භ කර නොතිබූ | 12 | - | 12 |
| එකතුව | 4824 | 62 | 4886 |

### 2.19.3 ප්‍රමාණවත් ලෙස ඉටු නොකල අරමුණු

ආයතනික අරමුණු කිසිසේත් ඉටුනොකර හෝ ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබූ අවස්ථා පහත දැක්වේ.

(අ) 2011 වර්ෂයේ පුත්තලම් දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා සැලසුම් කර තිබූ මාර්ග 12 න් රු.6,300,000 ක් වැයකර සංවර්ධනය කිරීමට නියමිතව තිබූ මාර්ග 09 ක් විවිධ හේතුමත සංවර්ධනයෙන් ඉවත් කර තිබූ අතර, ප්‍රධාන අමාත්‍යාංශය ඒ වෙනුවෙන් පුත්තලම් දිස්ත්‍රික්කයේ නව මාර්ග 04 ක් පමණක් සංවර්ධන වැඩසටහනට ඇතුළත් කර තිබුණි.

(ආ) 2011 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශය වයඹ පළාත් සිසු ගුරු අභිනන්දන වැඩසටහන යටතේ වෙන් කර තිබූ රු. 100,000 ක මුදලින් පුත්තලම දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයට අදාලව ප්‍රධාන අමාත්‍යාංශය මාර්ග 07 ක කි.මී. 3.95 ක දුර ප්‍රමාණයක් සංවර්ධනය සඳහා රු. 3,300,000 ක ප්‍රතිපාදිත මුදලක් වෙන් කර තිබූ අතර, ඉන් රු. 3,006,354 ක මුදලක් වැය කර කි.මී. 1.9 ක දුරක් පමණක් සංවර්ධනය කර තිබුණි.

(ඇ) කොබෙයිගනේ විවිධ සේවා සමූපකාරයට අයත් සහල් සැකසුම් මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා 2010 නොවැම්බර් 15 දින රේඛීය අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු රු. 2,000,000 ක ප්‍රදානයෙන් 2011 දෙසැම්බර් 01 දින වන විටත් රු. 1,600,000 ක් අදාළ කාර්යය සඳහා යොදවා ගැනීමෙන් තොරව තවදුරටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ) පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මධ්‍යම රජයේ පාසැල් 05 ක කරිහල් 05 ක් පිහිටුවීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් රු. 1,000,000 ක් 2010 නොවැම්බර් 25 දින ලබාදී තිබුණි. විගණන අවස්ථාව වූ 2011 දෙසැම්බර් 01 දින වන විටද එම කාර්යය නිම වී නොතිබුණි.

(ඊ) පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 2011 වර්ෂය අවසන් වන විට සමුපකාර විගණන කටයුතුවල නියුක්ත කාර්ය මණ්ඩලයේ 44 දෙනෙකුගේ පුරප්පාඩු සිදුවී තිබීම මත 2011 වර්ෂයේ ඉලක්කගත විගණනයන් සහ වාර්තා පිළියෙල කිරීමේ කටයුතු පිළිවෙලින් 71% ක් සහ 62% ක් වශයෙන් වූ කාර්ය සාධනයක් පමණක් පෙන්නුම් කර තිබුණි.

(උ) දැයට සෙවන ජාතික රුක්රෝපන වැඩසටහනට සමගාමීව 2011 වර්ෂයේදී වයඹ මාර්ග සංවර්ධන, විදුලිබල, නිවාස හා ඉදිකිරීම් සහ ධීවර කටයුතු අමාත්‍යාංශය විසින් කඩොලාන පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබූ අතර තෝරාගත් පාසල් 06 ක් සඳහා කලපු ආශ්‍රිතව එක් පාසලකින් කඩොලාන පැළ 1500 ක් සිටුවීම හා නඩත්තු කිරීම සඳහා ගිවිසුමකට එළඹීමෙන් තොරව එක් පාසලකට රු. 50,000 ක් බැගින් පාසල් 06 ක් සඳහා රු. 300,000 ක් ගෙවීම් කර තිබුණි. ව්‍යාපෘතියට අදාල පාසැල් 06 විසින් පැළ 9000 ක් සිටුවිය යුතු වුවද, 2010 මාර්තු 31 දිනට පාසල් විසින් සටුවා තිබූ භෞතික පැළ සංඛ්‍යාව 3545 ක් පමණි.

(ඌ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2011 වර්ෂය තුළ ගුරු මේස, ගුරු පුටු, ළමා මේස, ළමා පුටු හා ළදරු මේස, ළදරු පුටු ඒකක 3411 ක් රු. 4,005,610 කට මිලට ගෙන පාසල් 62 ක් අතර බෙදා දීම සඳහා ප්‍රතිපාදන ලැබී තිබූ නමුත් 2011 දෙසැම්බර් 31 දින වන විට පාසල් දෙකක් අතර ළමා මේස 90 ක් හා ළමා පුටු 90 ක් පමණක් බෙදා දී තිබුණි.

## 2.20 කොන්ත්‍රාත් පරිපාලනය

### 2.20.1 ව්‍යාපෘති/ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද

ප්‍රධාන අමාත්‍යාංශයේ පහත දැක්වෙන ව්‍යාපෘති/ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට තිබුණි.

| ව්‍යාපෘතිය/ යෝජනා ක්‍රමය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භකල දිනය | නිමකිරීමට ඉලක්කකල දිනය | 2011 දෙසැම්බර් 31 දින දක්වා දරන ලද වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු | |
| කල්කඩවල කනිෂ්ඨ විද්‍යාලයේ 20 x 20 සා.පෙළ විද්‍යාගාරය | 1,421,000 | - | - | 748,848 | කොන්ත්‍රාත්කරුගේ සිදුවූ ප්‍රමාදය සහ අත් මුදල් ලැබීමේ ප්‍රමාදය |

| | | | | | |
|---|---|---|---|---|---|
| දංකොටුව බාලිකා විදුහල 60 x 20 උ.පෙළ විද්‍යාගාරය | 4,860,603 | 2011.08.30 | 2011.11.30 | 1,378,722 | කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය මත ගිවිසුම අවලංගු කර වෙනත් අයකුට ප්‍රදානය කිරීමට කටයුතු කිරීම |
| සිසු සැරිය වාර්තාමය කෙටි චිත්‍රපටිය | 785,746 | - | - | - | සුදුසු අධ්‍යක්ෂකවරයෙක් තෝරා ගැනීමේ අපහසුතාවය |

## 2.20.2 සම්පූර්ණයෙන් අත්හැර දමා ඇති ව්‍යාපෘති/ යෝජනා ක්‍රම

පාසැල් 8 ක වැසිකිළි ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු.1,016,066 ක් වූ අතර, 2011 වර්ෂයේදී මේ සඳහා රු.600,000 ක මුදලක් වෙන්කර ඉතිරි මුදල් අදාල පාසැල්වල සංවර්ධන සමිති දැරිය යුතු නමුත් අදාල සමිතිවලට මූල්‍යමය හැකියාවක් නොමැතිවීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීය.

## 2.21 විගණන හා කළමනාකරණ කමිටු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

පළාත් සභාවේ මූල්‍ය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නියමිත රැස්වීම් තබා නොතිබුණු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පහත සඳහන් පරිදි විය.

| ආයතනය | නිරීක්ෂණ |
|---|---|
| පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි. |
| පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු | 2011 වර්ෂය සඳහා එක් රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි. |
| පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු | කමිටු රැස්වීම් 2 ක් පවත්වා තිබුණි. |
| සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | එක් කමිටු රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි. |

# 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ගිණුම්කරණය හා ආදායම් පාලනය

(ඇ) වත්කම් හා මානව සම්පත් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත්

(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ඊ) ප්‍රඥප්ති මත පිහිටවූ ආයතනවල මූල්‍ය හා මෙහෙයුම් පාලනය

(උ) වාහන භාවිතය